# ගැහැනු මායම්

මගේ අත්තම්මා ළගදි මියගියාය. මියයනතුරුම ඇගේ ප්‍රියතම වචනය වුයේ 'ගැහැනු මායම් 'යන්නය. ඇය එය තමාගේ ලේලිය විවේචනයට පවා මුලින් යොදා ගත්තාය. එහෙත් මගේ මව තම ස්වාමිපුරුෂයාට එනම් මගේ අප්පච්චිටද වඩා ආදර කරුණාවෙන් සංග්‍රහ කිරීමෙන් අත්තම්මාගේ සිත දිනා ගත්තාය.

අත්තම්මා දකින දකින ගැහැනියගේ ගැහැනු මායමක් දුටුවාය. අපේ ගෙදර වැඩට සහායවූ දයාවතී මින් බැට කෑ ප්‍රධාන එකියක වුවාය.

'ඒකිට නම් තියෙන්නේ මායම් හැට හතරක් නෙමෙයි එකසිය හැට හතරක් ' අත්තම්මා නිතර පැවසුවාය.

පොත්ත රතු දයාවතිගේ මුහුණෙහි ඇති ලකයක් නැතිමුත් හින්දෑරි ඇගේ ඇගපත නම් දැක්වූයේ මෝස්තර නිරූපිකාවකගේ හැඩයකි.

උයනගෙහි මැණිකා ශාරීරිකව දුර්වලවෙත්ම දයාවතී ඇයට උදව්වට දිනපතා අපේ ගෙදරට ආවාය.

උඩින් හැඳ සිටි ඇඳුම ගලවා දමන ඇය අත් කොට හැට්ටයකින් හා කඩමලු චීත්ත කෑල්ලකින් සැරසී පිටි කොටනු බලා ඉන්න බැරි තරමට ලස්සනය. මෝල්ගසත් සමග සෙලවෙන ඇගේ අඟපසඟ නැරඹීම සඳහා මේ වේලාවට නොවැරදීම අපේ උයන ගෙට එන්නේ රියැදුරු පියසේනය.

'ගනින්කො දයාවතියෙ කහට කෝප්පයක්' ඇගේ නිතඹ හොඳින් පෙනෙනා තැනකින් ඇති ලොව් බංකුවෙහි ඉඳගන්නා පියසේන කියන්නේය .

'උඹට හැමදාම තේ දුන්නේ ඒකිද බං' මේ අසන මැණිකා කිපෙන්නීය. ඇයට සිනාසෙන පියසේන පිටි කෙටීම අවසානවන තුරුම කහට කෝප්පය තොලගාන්නේය.

පොල් කැඩෙන කාලයට වත්තේ වැඩකරන සියාතුටද දයාවතී දකිනා විට වැඩ වැඩිය.

'උඹත් ඔය ගෙඩියක් දෙකක් ගනිං බං' ඔහු පවසන විට දයාවතී ගස්සන ගැස්සිල්ල අහළ ගම් හතක එකියකට කලහැක්දැයි සැක සහිතය .ඇගේ පැද්දෙන උකුල ඒ වෙලාවට බලන්න බැරි තරමට ලස්සනය. එකල කූඩා කෙළි පැටික්කියක වූ මම ද ඒ ගමන අනුගමනය කිරීමට තැත් කළෙමි .

'අනේ ඕකිගේ මායම්' අත්තම්මා දත්කූරු කෑවාය. මම හෙමින් අම්මා ලගට ගෑටුවෙමි .

'ගෑනුන්ට මායම් එකසිය හැට හතරක් තියනවද' මම අම්මාගෙන් ඇසුවෙමි.

'කවුද කීවේ' ඈ මා දෙස බලා සිනාසෙමින් ඇසුවාය.

'අත්තම්මා''නෑ ගෑනුන්ට තියෙන්නේ මායම් හැට හතරයි' කී ඈ මා ලගින් ඉඳගත්තාය.

'ඒ මොනවද' මම කුතූහලෙන් ඇසුවෙමි.

'ගෑනුන්ට පුලුවන් බලන විදියෙන්, කතා කරන විදියෙන්, හිනාවෙන විදියෙන්, පණිවිඩයක් දෙන්ට'

'මෙහෙමද?' මම ඇය දෙස රවා බැලුවෙමි. ඇය හඬනගා සිනාසුනාය.

'ඒකත් එක විදියක් තමයි ඒ උනාට මෙන්න මෙහෙම බැලුවොත්' ' ඈ මා වෙත කෝල බැල්මක් හෙලුවාය.

'අනේ හරි ලස්සණයි අම්මා හැම තිස්සෙම එහෙම බලන්නකෝ' අම්මා තවත් සිනාසුණාය.

'මට එහෙම බලන්න පුලුවන් ඔයාගේ අප්පච්චි දිහා විතරයි. නැත්නම් මට අත්තම්මාගෙන් සෝලි තියෙයි.'

මම අත්තම්මා ලගට ගෑටුවෙමි.

'අත්තම්මා පිරිමින්ට මායම් කීයක් තියනවද?' අත්තම්මා මා ඇය තුරුලට ඇද ගත්තාය.
'අනේ මගේ මැණිකේ උන්ට තියන මායම් මේ ලෝකේ කාටවත් ගණින්න බෑ'

ඒ කියමන කෙතරම් ඇත්තදැයි මා දන්නේ දැන්ය.

**ප්‍රවීනා පලිපාන**


# Professional Tutoring

English - Year 2 - 8

Mathematics - Year 2 -10

Maths Methods/General maths - Year 11

Maths Methods/ Specialist Maths/
Pure Maths - Year 12

Selective School Exams

Scholarship Exams

Qualified Tutors
Over 17 Years experience in Australia
Produced excellent results
Individual or Small group classes

Contact
03 9470 8295
0409 854 597
email - hemantha2020@yahoo.com.au
indyminik@yahoo.com.au

**හේමන්ත දේවේන්ද්‍ර**
**නෙරංජනා කුඩලිගම**

Home Visits possible

# MIGRATE TO AUSTRALIA

**MULTINATIONAL MIGRATION SERVICES & AUSTRALIAN MIGRATION SERVICES**

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

## ONSHORE

- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

## OFFSHORE

- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students

"EXPERIENCE THE DIFFERENCE"

Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**

Senior Migration Consultants:

**Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986**

**Tel: 03-94377384**
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

**Tel: 011 5 500 100**
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website

**www.multinational.com.au**

E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696